# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2014/15
## 2019 පෙබරවාරි - අප්‍රේල්
## සමාජීයවිද්‍යා පීඨය

## ජාත්‍යන්තර අධ්‍යයනය
## ජාත්‍යන්තර දේශපාලනය INTS – E 3015

(පැරණි නිර්දේශය)

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. ජාත්‍යන්තර දේශපාලනය පිළිබඳ යථාර්ථවාදී සහ ලිබරල්වාදී විවරණය විග්‍රහ කරන්න.

02. I ලෝක සංග්‍රාමයේ සිට එකිනෙකට වෙනස් වූ බලතුලන පද්ධතීන් ලෝක දේශපාලනය තුළ ක්‍රියාත්මක වූයේ කවර ආකාරයකටදැයි පැහැදිලි කරන්න.

03. තෘෂ්ණි යුද්ධය සහ පශ්චාත් තෘෂ්ණි යුද්ධ යුගවල ජාත්‍යන්තර දේශපාලනයෙහි ඇතිවූ ප්‍රවණතා සහ ප්‍රධාන වෙනස්කම් හඳුනාගන්න.

04. i. මතභේදයන්ට ලක්ව ඇති රාජ්‍යයන්ට දකුණු චීන මුහුදෙහි අදාළත්වය විස්තර කොට එම ගැටුමෙහි ස්වභාවය පැහැදිලි කරන්න.

ii. ආසියාන් සංවිධානය මෙම ගැටුම් සමනය කිරීමෙහිලා සාර්ථක යැයි ඔබ සිතන්නේද? අදහස් දක්වන්න.

05. <u>එක්කෝ</u>

"කාශ්මීර අර්බුදය විසඳාගත යුත්තේ ජනමත විචාරණයක් මඟිනි." මෙම ප්‍රකාශය පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න.

<u>නැතහොත්</u>

අප්‍රිකානු කලාපයේ ගැටුම්වල ස්වභාවය සහ ඒවා විසඳාගැනීමේදී අප්‍රිකානු සංගමයේ කාර්යභාරය විස්තර කරන්න.

06. i. අවිහරණය නිර්වචනය කොට රාජ්‍යයන් අවි තරඟයක නිරත වී සිටින්නේ මන්දැයි පැහැදිලි කරන්න.

ii. අවිහරණයට ඇති බාධක විස්තර කරන්න.

07. <u>එක්කෝ</u>

අරාබි වසන්තය ඇතිවීමට තුඩුදුන් හේතු විස්තර කොට ජාත්‍යන්තර දේශපාලනයට ඉන් ඇතිවූ බලපෑම් විස්තර කරන්න.

<u>නැතහොත්</u>

පලස්තීන අර්බුදයෙහි මූලාරම්භය සහ ඒ සඳහා ජාත්‍යන්තර මැදිහත්කරණයෙහි බලපෑම පැහැදිලි කරන්න.

08. එක්සත් ජාතීන්ගේ සංගමයෙහි විකාශනය සහ ප්‍රධාන ආයතනවල කාර්යභාරය විස්තර කරන්න.

********************